**කාන්තාවන්ට එරෙහි සියළු ආකාරයේ වෙනස් කොට සැලකීම තුරන් කිරීම පිළිබඳ කමිටුව**

**ශ්‍රී ලංකාව පිළිබඳ අටවැනි කාලාවර්තක වාර්තාව සම්බන්ධයෙන් අවසාන නිරීක්ෂණ**

1. කමිටුව 2017 පෙබරවාරි 22 වැනි දින සිය 1484 වැනි සහ 1485 වැනි රැස්වීම් වලදී ශ්‍රී ලංකාව පිළිබඳ අටවැනි වාර්තාව (CEDAW / C / LKA/ 8) සලකා බැලුවේය. (CRDAW/C/SR 1484 සහ CEDAW/C/SR/1485) කමිටුවේ ගැටළු සහ ප්‍රශ්න ලැයිස්තුව CEDAW/C/LKA/Q/8 අඩංගු වන අතර ශ්‍රී ලංකාවේ ප්‍රතිචාර CEDAW/C/LKA/Q./8[1] හි අඩංගු වේ.

අ. හැඳින්වීම

2. රාජ්‍ය පාර්ශ්වය සිය අටවැනි කාලාවර්තක වාර්තාව ඉදිරිපත් කිරීම කමිටුව අගය කරයි. පූර්ව - සැසි ක්‍රියාකාරී කණ්ඩායම විසින් මතු කරන ලද ගැටළු සහ ප්‍රශ්න ලැයිස්තුවට රාජ්‍ය පාර්ශ්වය ලිඛිත පිළිතුරු සැපයීමද එය අගය කරයි. රාජ්‍ය පාර්ශ්වයෙහි නියෝජිත කණ්ඩායමේ සහභාගිත්වය මෙන්ම එහි වාචික ඉදිරිපත් කිරීමද සංවාදය අතරතුරදී කමිටුව විසින් යොමු කරන ලද ප්‍රශ්නවලට ප්‍රතිචාර ලෙස ලිඛිතව වැඩිදුර පැහැදිලි කිරීම් ලබාදීමද එය අගය කරයි.

3. කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශයේ ලේකම් චන්ද්‍රානි සේනාරත්න මහත්මියගේ නායකත්වය යටතේ ජිනීවාහි එක්සත් ජාතීන්ගේ කාර්යාලයේ නිත්‍ය නියෝජිත, කොරියානු ජනරජයේ ශ්‍රී ලංකා තානාපතිනිය සහ විදේශ කටයුතු අමාත්‍යාංශයේ සහ නීතිපති දෙපාර්තමේන්තුවේ නියෝජිතයන් ඇතුළත් වූ රාජ්‍ය පාර්ශ්වයේ නියෝජිත කණ්ඩායමට කමිටුවේ ප්‍රශංසාව හිමි වේ.

ආ. සාධනීය අංශ

4. 2011 වසරේදී රාජ්‍ය පාර්ශ්වයෙහි පස්වැනි වාර්තාවේ සිට හත්වැනි වාර්තාව CEDAW/C/LKA/5-7) දක්වා වාර්තා සලකා බැලීමේ සිට ව්‍යවස්ථාදායක ප්‍රතිසංස්කරණ සිදු කිරීමේදී අත්කරගෙන ඇති ප්‍රගතිය, විශේෂයෙන්ම පහත සඳහන් සම්මත කරගැනීම් කමිටුව අගය කරයි.

(අ) ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවට කීර්තිමත් සාමාජිකයන් පත් කිරීම ඇතුළුව ජ්‍යෙෂ්ඨ අධිකරණවලට හා ප්‍රධාන ස්වාධීන කොමිෂන් සභාවලට පත්

[1] කමිටුව විසින් සිය හැට හය වැනි සැසිවාරයේදී 2017 පෙබරවාරි 13 - මාර්තු -3 සම්මත කර ගන්නා ලදී.

කිරීම් නිර්දේශ කිරීම සඳහා ව්‍යවස්ථාදායක සභාව ප්‍රතිෂ්ඨාපනය කරමින් 2015 දී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට කරන ලද දහනව වැනි සංශෝධනය

(ආ) අපරාධ වල වින්දිතයන් හා සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා ජාතික අධිකාරිය නිර්මාණය කළ 2015 අංක 04 දරන අපරාධ වින්දිතයන්ට හා සාක්ෂිකරුවන්ට සහාය වීමේ හා ආරක්ෂා කිරීමේ පනත සහ

(ඇ) පළාත් පාලන ආයතනවල කාන්තාවන් වෙනුවෙන් කෝටාව 25% ක් ලෙස ඇතුළත් කිරීම සඳහා 2016 පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් පනත සංශෝධනය කිරීම

5. කාන්තාවන්ට එරෙහි වෙනස් කොට සැලකීම තුරන් කිරීම සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවයට සමානාත්මතාව ප්‍රවර්ධනය කිරීම ඉලක්ක කරගනිමින් සිය ආයතනික සහ ප්‍රතිපත්තිමය රාමු වැඩි දියුණු කිරීමට රාජ්‍ය පාර්ශ්වය ගන්නා ප්‍රයත්න කමිටුව අගය කරයි.

(අ) කාන්තා අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සහ ප්‍රවර්ධනය කිරීම සම්බන්ධයෙන් වෙනම පරිච්ඡේදයක් අඩංගු ජාතික මානව හිමිකම් ක්‍රියාකාරී සැලැස්ම (2017-2021) 2017 දී සකස් කර අවසන් කිරීම;

(ආ) මිනිස් ජාවාරම නිරීක්ෂණය කර එයට එරෙහිව සටන් කිරීම සඳහා ජාතික උපායමාර්ගික සැලැස්ම 2016 දී සම්මත කර ගැනීම;

(ඇ) 2016 දී ලිංගික හා ස්ත්‍රී පුරුෂ සමාජ භාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වයට විසඳුම් සැපයීම පිණිස ප්‍රතිපත්ති රාමුව සහ ජාතික ක්‍රියාකාරී සැලැස්ම සම්මත කර ගැනීම;

(ඈ) 2015 දී 'ශ්‍රී ලංකාවේ ප්‍රතිසන්ධානය, වගවීම සහ මානව හිමිකම් ප්‍රවර්ධනය කිරීම' මානව හිමිකම් කවුන්සිල යෝජනා 30/1 වෙනුවෙන් සම අනුග්‍රාහකත්වය සහ ඒ යටතේ බැඳීම් ඉටු කිරීම පිණිස ගන්නා ලද පියවර; සහ

(ඉ) 2015 දී විශේෂ ක්‍රියාපටිපාටි බල පැවරුම දරන සියල්ලන්ටම රටට පැමිණීම සඳහා රාජ්‍ය පාර්ශ්වය විසින් නිකුත් කරන ලද ස්ථාවර ආරාධනය.

6. පෙර වාර්තාව සලකා බැලීමේ සිට ගෙවුණු කාලපරිච්ඡේදය තුළ රාජ්‍ය පාර්ශ්වය පහත සඳහන් ජාත්‍යන්තර සාධන පත්‍ර අපරානුමත කර හෝ පිළිගෙන තිබීම කමිටුව අගය කරයි:

(අ) 2016 වසරේදී ආබාධිකත්ව සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තිය සහ එයට වෛකල්පිත සන්ධානය යන දෙකම;

(ආ) 2016 වසරේදී සියළු තැනැත්තන් බලහත්කාරයෙන් අතුරුදහන් කරනු ලැබීමෙන් ආරක්ෂා කිරීම සඳහා ප්‍රඥප්තිය; සහ

(ඇ) 2015 වසරේදී අන්තර්ජාතික සංවිධානාත්මක අපරාධ වලට එරෙහි එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තියට (පැල්මෝ සන්ධානයට) අනුපූරකව පුද්ගලයන්, විශේෂයෙන්ම කාන්තාවන් හා ළමුන්, ජාවාරම වැළැක්වීම, මැඩ පැවැත්වීම හා එයට දඬුවම් කිරිම සඳහා වන සන්ධානය.

ඇ. පාර්ලිමේන්තුව

7. ප්‍රඥප්තිය පූර්ණ ලෙස ක්‍රියාත්මක කිරීම සහතික කිරීමේදී ව්‍යවස්ථාදායක බලය සතු තීරණාත්මක කාර්යභාරය කමිටුව අවධාරණය කරයි. (2010 හතලිස් පස්වැනි සැසිවාරයේදී සම්මත කරගන්නා ලද, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සමග සිය සබඳතාව පිළිබඳ කමිටු ප්‍රකාශය බලන්න.) තමන් සතු බල පැවරුමට අනුකූලව දැන් සහ ප්‍රඥප්තිය යටතේ මීළඟ වාර්තා කිරීමේ කාලපරිච්ඡේදය අතරතුර මෙම වර්තමාන අවසාන නිරික්ෂණ ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් අවශ්‍ය පියවර ගන්නා ලෙස එය පාර්ලිමේන්තුවට ඇරයුම් කරයි.

ඇ. සැලකිල්ලට භාජනය වන ප්‍රධාන ක්ෂේත්‍ර සහ නිර්දේශ
ප්‍රඥප්තියෙහි නෛතික තත්ත්වය

8. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12, 17, 27 සහ 126 ව්‍යවස්ථා සහ දේශීය ව්‍යවස්ථාදායක පනත් සහ නියමයන් ගණනාවක් ප්‍රඥප්තිය බලාත්මක කිරීම සඳහා ප්‍රමාණවත් රාමුවක් සපයන බවට නියෝජිත කන්ඩායමේ ප්‍රතිචාරය කමිටුව සැලකිල්ලට ගනී. කෙසේ වෙතත්, ප්‍රඥප්තිය තුළ ගැබ් කොට ඇති සියළු අයිතිවාසිකම් කාන්තාවන් විසින් ව්‍යාපරණය කිරීම සහතික කිරීමට ප්‍රමාණවත් ලෙස පවතින දේශීය නෛතික රාමුව ව්‍යාප්ත වී නොමැති වීම සම්බන්ධයෙන් කමිටුව තවදුරටත් සැලකිලිමත්ව සිටී.

9. තවදුරටත් ප්‍රමාදයකින් තොරව, ප්‍රඥප්තියෙහි සියළු විධිවිධාන ජාතික නීතියට ඇතුළත් කර ගැනීම රාජ්‍ය පාර්ශ්වය සිදු කළ යුතුය යන සිය පූර්ව නිර්දේශය (CEDAW/C/LKA/CO/7, 13 ඡේදය) කමිටුව යළි අවධාරණය කරයි.

කාන්තාවන්ට එරෙහි වෙනස් කොට සැලකීම තහනම් කිරීම සඳහා නෛතික රාමුව.

10. දැනට සිදුවෙමින් පවතින ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය කමිටුව අගය කරයි. කෙසේ වෙතත්, එම ක්‍රියාවලිය තුළ කාන්තාවන්ගේ සීමිත සහභාගිත්වය පිළිබඳව එය තවදුරටත් කණස්සලු සහගතව සිටී. සමානාත්මතාවට ඇති අයිතිය යටතේ ලිංගික නැඹුරුව මත පදනම්ව වෙනස් කොට සැලකීම තහනම් කෙරෙන්නේද යන්න සම්බන්ධයෙන් නම් අවිනිශ්චිතතාවක් පැහැදිලි කිරීම පිණිස, ලිංගික නැඹුරුව සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය වෙනස් කොට නොසැලකීම සඳහා පදනමක් ලෙස විශේෂිතව ඇතුළත් කිරීම සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලයේ මූලික අයිතිවාසිකම් පිළිබඳ අනු කාරක සභාවේ යෝජනාව සම්බන්ධයෙන් රාජ්‍ය පාර්ශ්වයේ ප්‍රතිචාරය කමිටුව සටහන් කර ගනී. කෙසේ වෙතත්, රාජ්‍ය පාර්ශ්වය මෙම යෝජනාව පිළිගැනීම සම්බන්ධයෙන් අපැහැදිලි බවක් පවතින බව කමිටුව නිරීක්ෂණය කරයි. තවද, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(2) ව්‍යවස්ථාව කාන්තාවන්ගේ සහ පිරිමින්ගේ සමානාත්මතාව සහතික කරන නමුත් :

(අ) ප්‍රඥප්තියෙහි 1 වැනි වගන්තිය අනුව අවශ්‍ය වන පරිදි එය සෘජුව හෝ වක්‍රව කාන්තාවන්ට එරෙහි වෙනස් කොට සැලකීම තහනම් නොකරන බවත්;

(ආ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 16(1) ව්‍යවස්ථාව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව බලාත්මක වීමට පෙර පැවති වෙනස් කොට සැලකීම සිදුකරන නීති අධිකරණය මගින් සමාලෝචනයට ඉඩ ප්‍රස්ථා නොලබන බවත්;

(ඇ) නීති සහ ප්‍රතිපත්ති ඡේදනීය වෙනස් කොට සැලකීම ආමන්ත්‍රණය නොකරන බවත්;

කනස්සල්ලෙන් යුතුව නිරීක්ෂණය කරයි.

11. පැහැදිලිව නිශ්චය කරන ලද කාලරාමුවක් තුළ රාජ්‍ය පාර්ශ්වය පහත සඳහන් දේ ඉටු කළ යුතු බවට කමිටුව නිර්දේශ කරයි:

(අ) නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව කෙටුම්පත් කිරීමේ ක්‍රියාවලිය තුළ කාන්තාවන්ගේ පූර්ණ සහභාගිත්වය සහතික කිරීම;

(ආ) ලිංගක නැඹුරුව හා ස්ත්‍රී පුරුෂ සමාජභාව අනන්‍යතාව වෙනස් කොට සැලකීම සඳහා තහනම් පදනමක් ලෙස ඇතුලත් කිරීමට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලයේ මූලික අයිතිවාසිකම් පිළිබඳ අනු කාරක සභාව කර ඇති යෝජනාවට නිසි සැලකිල්ල ලබා දීම;

(ඇ) සියළුම නීතිවල අධිකරණ සමාලෝචනය හඳුන්වා දීම සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 16(1) ව්‍යවස්ථාව පරිච්ඡින්න කිරීම;

(ඉ) කුලය මත පදනම් වූ වෙනස් කොට සැලකීම ඇතුළුව අන්තශ්ඡේදන වෙනස් කොට සැලකීම ආමන්ත්‍රණය කිරීම ප්‍රතිපත්ති හා වැඩසටහන් සම්මත කර ගැනීම සහ ක්‍රියාත්මක කිරීම.

අසාධාරණ ලෙස සලකන නීති

12. මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කරන සියළු නීති සිය පස් වසරක කාලරාමුව තුළ සමාලෝචනය කර පරිච්ඡින්න කිරීම සඳහා ජාතික මානව හිමිකම් ක්‍රියාකාරී සැලැස්මේ (2017-2021) නිර්දේශ කමිටුව සැලකිල්ලට ගනී. අනුප්‍රාප්තිය, උරුමය සහ හවුල් හිමිකාරිත්වයට අදාලව ඉඩම් සංවර්ධන ආඥාපනතේ වන වෙනස් කොට සැලසීමේ විධිවිධාන පරිච්ඡින්න කිරීමේ සංශෝධන කෙටුම්පත නීති කෙටුම්පත සම්පාදක දෙපාර්තමේන්තුව වෙත යවා ඇති බවද, මුස්ලිම් විවාහ හා දික්කසාද පනතට සංශෝධන යෝජනා කිරීම සඳහා 2016 ඔක්තෝබර් මසදී අමාත්‍ය මණ්ඩල අනුකමිටුවක් පත් කරන ලද බවද කමිටුව තවදුරටත් සැලකිල්ලට ගනී. උඩරට නීතිය හා තේසවලාමයි නිතිය තුළ වෙනස් කොට සැලකීමේ විධිවිධාන ප්‍රතිසංස්කරනය සම්බන්ධයෙන් ප්‍රගතියක් නොමැති වීම සම්බන්ධයෙන් කමිටුව සැලකිලිමත් වේ.

13. ප්‍රඥප්තියෙහි 1 වැනි සහ 2 වැනි වගන්ති හා තිරසාර සංවර්ධන ඉලක්ක 5. සියළු කාන්තාවන්ට හා ගැහැණු ළමුන්ට එරෙහි වෙනස් කොට සැලකීම අවසන් කිරිමේ 5.1 ඉලක්කය අතර සබඳතාවන් වෙත කමිටුව අවධානය යොමු කරවයි. සිය පෙර නිර්දේශ (A/57/38, 275 ඡේදය) සහ 2011 (CEDAW/C/LKA/CO/7, 17 ඡේදය) යළි අවධාරණය කරන කමිටුව, රාජ්‍ය පාර්ශ්වය කාන්තාවන්ගේ පූර්ණ සහභාගිත්වය සහිතව සිය නීති ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය වේගවත් කිරිමෙන් මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කරමින් වෙනස් කොට සලකන සියළු නීති, විශේෂයෙන් ම පහත සඳහන් නීති, නිශ්චිත කාලරාමුවක් තුළ සමාලෝචනය කර පරිච්ඡින්න කිරීමත් නිර්දේශ කරයි.

(අ) අනුප්‍රාප්තිය, උරුමය සහ හවුල් හිමිකාරිත්වයට අදාලව ඉඩම් සංවර්ධන ආඥාපනතේ ඇති වෙනස් කොට සලකන විධිවිධාන පරිච්ඡින්න කිරීම සහ

(ආ) ඉඩම් සහ දේපල හිමිකාරිත්වය, උරුමය, පැවරීම හා බැහැර කිරීම නියාමනය කරන මෙන්ම නෛතික ශක්‍යතාව, විවාහ, දික්කසාද සහ ළමා භාරකාරත්වය නියාමනය කරන වෙනස් කොට සලකන විධිවිධාන ඉවත් කිරීම පිණිස මුස්ලිම්, උඩරට සහ තේසවලාමෙයි පෞද්ගලික නීති ඇතුළු සියළු පෞද්ගලික නීති සංශෝධනය කිරීම.

යුක්තිය කරා ප්‍රවේශය

14. පහත සඳහන් දේ ඇතුළුව යුක්තිය කරා ප්‍රවේශවීමට කාන්තාවන්ට තවදුරටත් පවතින බාධක සම්බන්දයෙන් කමිටුව සැලකිලිමත් වෙයි:

(අ) නීතිය ක්‍රියාවේ යෙදවීමේ නිලධාරීන්ගේ හා නීති වෘත්තිකයන්ගේ පාර්ශ්වයෙන් ස්ත්‍රී පුරුෂ සමාජ භාව සමානාත්මතාව පිලිබඳ සීමිත දැනුම;

(ආ) තම අයිතිවාසිකම්වලට හිමිකම් පෑමට බලාපොරොත්තු වන කාන්තාවන්, විශේෂයෙන්ම දෙමළ කාන්තාවන්, මුහුණ පාන භාෂාමය බාධක; සහ

(ඇ) ලිංගික හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය වාර්තා කිරීමෙන් වින්දිත කාන්තාවන්, සහ ගැහැණු ළමුන් වැළැක්වීමට හේතුවන සමාජ හා සංස්කෘතික අපකීර්තිය මෙන්ම පලිගැනීමට ලක්වනු ඇතැයි යන බිය.

15. කාන්තාවන්ට යුක්තිය කරා ප්‍රවේශය සම්බන්ධය සිය පොදු නිර්දේශ අංක 33 (2015) යළි සිහිපත් කරවන කමිටුව, රාජ්‍ය පාර්ශ්වය පහත සඳහන් දේ කළ යුතු බවට නිර්දේශ කරයි:

(අ) කාන්තාවන්ගේ අයිතිවාසිකම් සුරක්ෂිත කිරීමේ මාර්ගයක් ලෙස අධිකරණය ස්වාධීන, අපක්ෂපාති, වෘත්තියමය හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය කෙරෙහි සංවේදී වන බවට වගබලා ගැනීම සඳහා ප්‍රඥප්තිය මෙන්ම කමිටුවෙ පොදු නිර්දේශ සහ විකල්ප සන්ධානය යටතේ එහි නීති විද්‍යාව පිළිබඳව විනිසුරුවරුන්ට, අභිචෝදකයන්ට. නීතිඥවරුන්ට, පොලීසියට හා අනෙකුත් නීතිය ක්‍රියාවේ යොදවන නිලධාරින්ට ක්‍රමානුකූල ධාරිතා වර්ධනය ලබා දීම;

(ආ) රටේ උතුරේ සහ නැගෙනහිර දෙමළ කථා කරන නීතිය ක්‍රියාවේ යොදවන නිලධාරීන් සංඛ්‍යාව වැඩි කිරීම;
(ඇ) තම අයිතිවාසිකම් වලට හිමිකම් පාන කාන්තාවන් හා ගැහැණු ළමුන් අපකීර්තියට ලක් කිරිම තුරන් කිරීම සඳහා කාන්තාවන්ගේ නෛතික සාක්ෂරතාව වැඩි කිරීම හා තම අයිතිවාසිකම් පිළිබඳව කාන්තාවන්ගේ හා පිරිමින්ගේ දැනුවත් බව වැඩි කිරීම.

**කාන්තාවන්, සාමය සහ ආරක්ෂාව - සංක්‍රාන්ති යුක්ති යාන්ත්‍රණ**

16. මානව හිමිකම් කවුන්සලයෙහි 30/1 යෝජනාවට අනුකූලව සත්‍යය සෙවීම, යුක්තිය, හානිපූරණය හා යළි සිදුවීම වැළැක්වීම සඳහා යාන්ත්‍ර නසැලසුම් කර ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලිය සම්බන්ධයෙන් 2016 දී උපදේශක කාර්ය සාධන බලකායක් පත් කිරීම ඇතුළුව, සංක්‍රාන්ති යුක්තිය, නැවත පදිංචි කිරීම සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරන වෙනුවෙන් වැඩසටහන් සකස් කිරීම සම්බන්ධයෙන් කමිටුව ප්‍රශංසා කරයි. කාර්ය සාධන බලකා වාර්තාව 2017 ජනවාරි මස පිළියෙල කර අවසන් කිරීමද කමිටුව සැලකිල්ලට ගනි. කෙසේ වුවත් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් කමිටුව කණස්සල්ල පළ කරයි:

(අ) සාමය ගොඩ නැගීමේ, යළි ගොඩනැගීමේ හා ප්‍රතිසන්ධාන ක්‍රියාවලී තුළ කාන්තාවන්ගේ ඌන නියෝජනය සහ රාජ්‍ය පාර්ශ්වයෙහි පශ්චාත් ගැටුම් ක්‍රියාවලි සඳහා මගපෙන්වීම සඳහා වූ කාන්තාවන් හා සාමය සහ ආරක්ෂාව පිළිබඳව ආරක්ෂක කවුන්සිල යෝජනා අංක 1325 (2000) සහ ඉන් පසුකාලීනව ඉදිරිපත් කරන ලද යෝජනා ක්‍රියාත්මක කිරිම පිණිස සකස් කර අවසන් කරන ලද ජාතික ක්‍රියාකාරී සැලැස්මක් නොමැති වීම;

(ආ) පරිපූර්ණ සංක්‍රාන්ති යුක්ති උපායමාර්ගයක් ඇතුළුව, විවිධ සංක්‍රාන්ති යුක්ති සංරචක සැලසුම් කර ස්ථාපනය කිරීමට ඉඩ සලසන ව්‍යුහයන් පිහිටුවීම සම්බන්ධ මන්දගාමී ප්‍රගතිය; සහ

(ඇ) 2016 අංක 14 දරන අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය පනතට ජනාධිපතිවරයාගේ අත්සන ලබා ගැනීමේ ප්‍රමාදය සහ ජාත්‍යන්තර සහයෝගිතාව වෙනුවෙන් විධිවිධාන සලස්වන 11 (අ) ඡේදය ඉවත් කිරීම සඳහා පනත සංශෝධනය කිරිමට ඉඩ ඇති බවට ලැබෙන වාර්තා.

17. කමිටුව තාවකාලික විශේෂ ක්‍රියාමාර්ග පිළිබඳ සිය පොදු නිර්දේශ අංක 25 (2004) සහ ගැටුම් වැළැක්වීමේදී, ගැටුම් අතරතුර හා පශ්චාත් ගැටුම්

තත්ත්වයන් තුළ කාන්තාවන් සම්බන්ධයෙන් අංක 30 (2013) පොදු නිර්දේශය යළි සිහිපත් කරමින් රාජ්‍ය පාර්ශ්වය පහත සඳහන් දේ ඉටු කිරීම නිර්දේශ කරයි :

(අ) 1325 (2000) යෝජනාවට අනුකූලව පශ්චාත් ගැටුම් යළි ගොඩනැගීමේ ක්‍රියාවලියෙහි සියළු අදියරවලදී කාන්තාවන් පූර්ණ ලෙස සම්බන්ධ කර ගැනීම සහ සියළු සංක්‍රාන්ති යුක්ති යාන්ත්‍රණවල 50% ක කාන්තා නියෝජනය තිබිය යුතුය යන උපදේශක කාර්ය සාධක බලකා නිර්දේශ ක්‍රියාත්මක කිරීම, පැහැදිලි කාලරාමුවක්, පිල් සලකුණු, විශේෂිත අයවැය සහ නිරන්තර අධීක්ෂණ යාන්ත්‍රණයක් සහිතව මාර්ග සිතියමක් සපයන පරිපූර්ණ ජාතික ක්‍රියාකාරී සැලැස්මක් මෙම යෝජනාවට අදාලව සකස් කර නිම කිරීම සහ ආරක්ෂක කවුන්සිලය ඉන් පසුකාලීනව ඉදිරිපත් කරන ලද යෝජනා 1820 (2008), 1888 (2009), 1889 (2009), 2122 (2013) සහ 2242 (2015) මෙන්ම කමිටුවේ පොදු නිර්දේශ අංක 30 හි අඩංගු සම්පූර්ණ පරාසය සැලකිල්ලට ගැනීම;

(ආ) වගවීම් යාන්ත්‍රණ ක්‍රියාවලියෙහි ස්වාධීනත්වය හා අපක්ෂපාති බව වෙනුවෙන් අවශ්‍ය සහතිකයක් ලෙස එතුළ ජාත්‍යන්තර සහභාගීත්වය පවතින බවට වගබලා ගැනීම සහ මානවහිමිකම් කවුන්සිලයේ යෝජනා අංක 30/1 (A/HRC/RES/30/1) 6 වැනි ඡේදයට අනුකූලව ජාත්‍යන්තර විනිසුරුවරුන්ගේ, අභිචෝදකයන්ගේ, විමර්ශකයන්ගේ හා නීතිඥවරුන්ගේ සහභාගීත්වය සහතික කිරීම;

(ඇ) ජාත්‍යන්තර ප්‍රමිතිවලට අනුකූලව අධිකරණ හා සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීමේ වැඩසටහන්වල ස්වාධීනත්වය සහ සඵලදායකබව වඩාත් හොඳින් ආරක්ෂා කිරීමේ ක්‍රියාමාර්ග ඇතුළත් කිරීම සඳහා අපරාධ වල වින්දිතයන්ට හා සාක්ෂිකරුවන්ට සහායවීමේ හා ඔවුන් ආරක්ෂා කිරීමේ පනත සමාලෝචනය කර සංශෝධනය කිරීමේ කටයුතු වේගවත් කිරීම.

කාන්තාවන්ගේ අභිවෘද්ධිය වෙනුවෙන් ජාතික යාන්ත්‍රණය

18. 2017 වර්ෂයේදී කාන්තාවන් පිළිබඳ ස්වාධීන ජාතික කොමිෂන් සභාවක් ස්ථාපනය කිරීම සඳහා යෝජනාවකට අමාත්‍ය මණ්ඩලය අනුමැතිය ලබා දීම කමිටුව අගය කරයි. තවද, කාන්තා ගෘහමූලික කුටුම්බ පිළිබඳ ප්‍රතිපත්තියකට හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය ප්‍රධාන ප්‍රවාහගත කිරීමේ කමිටු ස්ථාපනය කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාදීමද එය අගය

කරයි. ඒකාබද්ධ වී නොමැති ජාතික රාමුව, රාජ්‍ය පාර්ශ්වය තුළ කාන්තා අයිතිවාසිකම්වල අභිවෘද්ධියෙහි බරපතල අකාර්යක්ෂමතාවන්ට මග පාදනු ඇතැයි කමිටුව කණස්සලු වෙයි. 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිය පනත බලාත්මකව තිබුණද සකස් කර අවසන් කරන ලද සියළු සැලසුම් ප්‍රසිද්ධියට පත් කර නොමැති බවත්, ඒවායේ පිල් සලකුණු, කාලරාමු හා වෙන් කරන ලද සම්පත් මෙන්ම මෙම සැලසුම් අධීක්ෂණය කිරීම සඳහා පත් කරන ලද අන්තර් අමාත්‍යාංශ මෙහෙයුම් කමිටුවේ කාර්යය ප්‍රසිද්ධියට පත්වී නොමැති බවද කමිටුව කණස්සල්ලෙන් යුතුව සටහන් කරයි. කාන්තාවන් පිළිබඳ ජාතික කොමිෂන් සභාව ස්ථාපනය කිරීම පිණිස කාලරාමුවක් නොමැතිවීම සම්බන්ධයෙන් තමන් පෙර සඳහන් කරන ලද කණස්සල්ල (CEDAW/C/LKA/CO/7, 16 ඡේදසය) කමිටුව තවදුරටත් අවධාරණය කරයි.

19. සඵලදායක ජාතික යාන්ත්‍රණය හා ප්‍රචාරය පිළිබඳ සිය පොදු නිර්දේහ අංක 6 (1988) සහ විශේෂයෙන්ම ජාතික යාන්ත්‍රණ සඵලදායක ලෙස ක්‍රියාත්මක වීම සඳහා අවශ්‍ය තත්ත්වයන් සම්බන්ධයෙන් බෙයිජිං ක්‍රියාකාරකම් සඳහා වේදිකාව තුලින් සපයන ලද මාර්ගෝපදේශකත්වය සිහිපත් කරන කමිටුව සිය පෙර නිර්දේශ (A/57/38, 277 ඡේදය. CEDAW/C/LKA/CO/7 , 19 ඡේදය) යළි අවධාරණය කරමින් රාජ්‍ය පාර්ශ්වයට පහත සඳහන් දේ නිර්දේශ කරයි.

(අ) දැනට පවතින විවිධ ක්‍රියාකාරී සැලසුම් එක් සංසක්ත උපායමාර්ගයකට ඒකාබද්ධ කර ඒවා ක්‍රියාත්මක කිරිම සඳහා මානව, තාක්ෂණික හා මූල්‍ය සම්පත් සැපයෙන බවට වග බලා ගැනීම;

(ආ) නිශ්චිත කාලරාමුවක් තුළ, කාන්තාවන් පිළිබඳ ස්වාධීන ජාතික කොමිෂන් සභාවක ව්‍යවස්ථාදායක ස්ථාපනය හා සඵලදායක ක්‍රියාකාරිත්වය සිදුවන බවට වග බලා ගැනිම;

(ඇ) රාජ්‍ය පාර්ශ්වය තුළ කාන්තා අයිතිවාසිකම් වල අභිවෘද්ධිය පිළිබඳ ඒකාබද්ධ ක්‍රියාකාරී සැලැස්ම අධීක්ෂණය කිරීමේදී හා ඇගයිමේදී සිවිල් සමාජයෙහි සහ කාන්තාවන් පිලිබඳ ජාතික කොමිෂන් සභාවෙහි සක්‍රිය සහභාගිත්වය පවතින බවට වග බලා ගැනිම.

තාවකාලික විශේෂ ක්‍රියාමාර්ග

20. ප්‍රඥප්තියෙහි සියළු ක්ෂේත්‍ර තුළ පිරිමින් හා කාන්තාවන් අතර අර්ථවත් සමානාත්මතාව සාක්ෂාත් කර ගැනීම වේගවත් කිරීම සඳහා තාවකාලික විශේෂ ක්‍රියාමාර්ග භාවිතා කිරීම සම්බන්ධයෙන් තොරතුරු නොමැති වීම පිළිබඳව සිය පෙර සැලකිලිමත් වීම (EDAW/C/LKA/CO/7, 20 ඡේදය) කමිටුව යළි අවධාරණය කරයි.

21. ප්‍රඥප්තියෙහි 4 වැනි වගන්තියෙහි 1 වැනි ඡේදය සහ තාවකාලික විශේෂ ක්‍රියාමාර්ග පිළිබඳ කමිටුවේ පොදු නිර්දේශ අංක 25 (2004) සමග අනුකූලව, වාර්ගික, ආගමික හා ලිංගික සුළුතර කොටස්වලට අයත් කාන්තාවන්, ගෘහ මූලික කාන්තාවන්. අභ්‍යන්තර වශයෙන් අවතැන් වූ කාන්තාවන් හා ආබාධිත කාන්තාවන් කෙරෙහි විශේෂ අවධානය සහිතව, විශේෂයෙන් පොදු හා දේශපාලනික ජීවිතය තුළ සහ තීරණ ගැනීම, අධ්‍යාපනය හා රැකියා තුළ කාන්තාවන් හා පිරිමින් අතර අර්ථවත් සමානාත්මතාව සාක්ෂාත් කර ගැනීම වේගවත් කිරීම පිණිස නිශ්චිත අරමුනු හා දිරිගැන්වීම්, ව්‍යාප්තිය හා සහායක වැඩසටහන්. නෛතික අනුමැතිය, විශේෂ අයවැය වෙන් කිරීම් හා වෙනත් ප්‍රතිඵල අත් කර ගැනීම කෙරෙහි නැඹුරු වූ ප්‍රගාමී ක්‍රියාමාර්ග සහිත තාවකාලික විශේෂ ක්‍රියාමාර්ග රාජ්‍ය පාර්ශ්වය යොදා ගත යුතු බවට කමිටුව නිර්දේශ කරයි.

කාන්තාවන්ට එරෙහි ඒකාකෘති හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය

22. ජාතික මානව හිමිකම් ක්‍රියාකාරි සැලැස්මෙහි (2017-2021) සහ ලිංගික හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වයට විසඳුම් සැපයිම සඳහා වන ජාතික ක්‍රියාකාරි සැලැස්මෙහි ඇතුළත් කර ඇති පරිදි, මාධ්‍ය තුළ ඒකාකෘති තුරන් කිරීම පිණිස උපායමාර්ග, සම්බන්ධ වී ඇති ප්‍රචණ්ඩත්වයෙහි ප්‍රමාණය නොසලකා කලත්‍රයාගේ කැමැත්ත නොමැති සියළු තත්ත්වයන්හිදී වෛවාහික ස්ත්‍රී දූෂණය අපරාධ වරදක් බවට පත් කිරීම සඳහා ඉහළ මට්ටමේ නිර්දේහ සහ සාක්ෂි ආඥා පනතේ ඇති කාන්තාවන්ගේ සාක්ෂි වල විශ්වසනීයතාවය පිළිබඳව වෙනස් කොට සැලකීමේ විධිවිධාන ඉවත් කිරීම මගින් ඇතුළුව ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය වැලැක්වීමේ පනත ශක්තිමත් කිරිමට යෝජිත සංශෝධන කමිටුව අගය කරයි. කෙසේ වෙතත් ලිංගික හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම්වූ ප්‍රචණ්ඩත්ව ක්‍රියාවන් වෙනුවෙන් දූර්විපාක නොලබා සිටීමේ සංස්කෘතියක් ඉවසන පුරුෂාධිපත්‍ය ආකල්ප සහ වෙනස් කොට සලකන ඒකාකෘති දිගින් දිගටම පැවතීම සම්බන්ධයෙන් කමිටුව තවදුරටත් කණස්සලු සහගතව සිටී. එය පහත සඳහන් කරුණු පිළිබඳව උනන්දු වෙයි.

(අ) රාජ්‍ය පාර්ශ්වය තුළ කාන්තාවන්ට එරෙහි ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය ඉහළ මට්ටමින් පැවතිම සහ ප්‍රමාණවත් නිති නොමැතිකම,

පලිගැනීමට ලක්වීමට ඇති බිය ඇතුළු හේතු මත කාන්තාවන්ට යුක්තිය කරා ප්‍රවේශය සීමිත වීම, එබඳ සිද්ධි විමර්ශනය හා විනිසීම අතිශයින් ප්‍රමාද වී සිදුවීම, විවාදාත්මක ප්‍රතිඵල හා දඬුවම් පැමිණවීම් අනුපාතිකය ඉතා පහළ මට්ටමක පැවතීම හේතුවෙන් කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්ව සිදුවීම් ඌන වාර්තාකරණය;

(ආ) ගෘහස්ථ ප්‍රචණ්ඩත්ව සිද්ධි වලදී අධිකරණයේ නඩු පැවරීම සඳහා අවශ්‍යතාවක් ලෙස වින්දිතයන්ට බිය වැද්දීම් හේතුවෙන් කාන්තාවන් සිය පැමිනිලි ඉල්ලා අස් කර ගැනීමේ ප්‍රතිඵලයකට හේතු වන සමථකරණය සහභාගි වීමට සිදුවීම;

(ඇ) කාන්තාවන්ට එරෙහි ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩ සිදුවීම් වලට අදාලව විමර්ශනය, අභිචෝදනය හා දඬුවම් නියම කිරීම, වින්දිතයන්ට සහාය හා ආරක්ෂාව කරා කාන්තාවන්ට හා ගැහැණු ළමුන්ට ඇති ප්‍රවේශය සිමාසහිත වීම හා රාජ්‍ය පාර්ශ්වය තුළ රැකවරණ නිවාස සංඛ්‍යාව පිළිබඳ ක්‍රමානුකූල දත්ත රැස් කිරීම සිදු නොවීම

23. කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය පිළිබඳ සිය පොදු නිර්දේහ අංක 19 (1992) සහ කාන්තාවන්ට යුක්තිය කරා ප්‍රවේශය පිළිබඳ පොදු නිර්දේශ අංක 33 (2015) යළි සිහිපත් කරමින් කමිටුව. සිය පූර්ව නිර්දේශ (A/57/38, 289 ඡේදය, CEDAW/C/LKA/CO/7, 23 සහ 25 ඡේද) යළි අවධාරණය කරන අතර රාජ්‍ය පාර්ශ්වය පහත සඳහන් දේ ඉටු කළ යුතු බවට තවදුරටත් නිර්දේශ කරයි.

(අ) වෛවාහික ස්ත්‍රී දූෂණය අපරාධ වරදක් බවට පත් කිරිම සහ දැඩි ලිංගික ප්‍රචණ්ඩත්ව ආකාර ඇතුලත් කිරීම සඳහා වධහිංසා පනතේ වධහිංසා පිළිබඳ නිර්වචනය වඩාත් පුළුල් කිරීම;

(ආ) අධිකරණයෙන් ආරක්ෂා නියෝගයක් නිකුත් කරනු ලැබූ වහාම එය අදාල පාර්ශ්වයන් වෙත සපයනු ලැබ සඵලදායක ලෙස ක්‍රියාත්මක කෙරෙන බවට වග බලා ගැනීම සහ අධිකරණයෙහි නඩුවක් පැවරීමට පෙර සමථකරණ ක්‍රියාවලියට සහභාගි වීමේ අවශ්‍යතාව ඉවත් කිරීම සඳහා ගෘහස්ත ප්‍රචණ්ඩත්වය වැලැක්වීමේ පනත සංශෝධනය කිරීම;

(ඇ) ලිංගික ප්‍රචණ්ඩත්වය පිළිබඳ නඩු සම්බන්ධ කටයුතු කඩිනම් කිරීම සඳහාත්, කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්ව ක්‍රියා යනුවෙන් අත් හිටවූ සිරදඬුවම් තහනම් කිරිමට සහ අනිවාර්ය අවම සිරදඬුවම් නියම කිරීමට නීතිපති දෙපාර්තමේන්තුව තුළ වෙනම ඒකකයක් පිහිටුවිම;

(ඇ) ලිංගික හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වයට විසඳුම් සැපයීම සඳහා වන ජාතික ක්‍රියාකාරී සැලැස්ම සඵලදායක ලෙස ක්‍රියාත්මක කිරිම සහ රැකවරණ නිවාස සංඛ්‍යා වැඩි කිරීම හා වෛද්‍ය ප්‍රතිකාර. නීති සහාය, මනෝ සමාජ පුනරුත්ථාපනය, සමාජානුයෝජන වැඩසටහන් සහ වින්දිතයන් වෙනුවෙන් වන්දි සැපයීම මගින් ඇතුළුව සමෝධානික හා සඵලදායක ආකාරයෙන් එය ක්‍රියාත්මක වීම සහතික කිරීම සඳහා ප්‍රමානවත් සම්පත් වෙන් කිරීම;

(ඉ) කාන්තාවන්ට එරෙහි වෙනස් කොට සැලකීමේ ඒකාකෘති සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වයට විසඳුම් සැපයිම සඳහා උපායාමර්ගික මාධ්‍ය ව්‍යාපාර සහ අධ්‍යාපනික වැඩසටහන් හරහා මහජනතාව දැනුවත් කිරීමේ ප්‍රයත්න වැඩි කිරීම;

(ඊ) කමිටුව විසින් මෙයට පෙර නිර්දේශ කරන ලද පරිදි (A/57\38. 285 ඡේදය) කාන්තාවන්ට එරෙහි සියළු ආකාරයේ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය පිළිබඳ දත්ත වයස, වාර්ගික කණ්ඩායම, ප්‍රදේශය සහ වින්දිතයා සහ අපරාධකරු අතර සබඳතාව අනුව වෙන් කර ක්‍රමානුකූලව රැස් කිරීම හා විශ්ලේෂණය කිරීම සිදුවන බවට වග බලා ගැනීම.

ගැටුම හා සබැඳි කාන්තාවන්ට එරෙහි ලිංගික හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය

24. කමිටුව පහත සඳහන් දේ කෙරෙහි කණස්සලු සහගතව සැලකිල්ල යොමු කරයි :

(අ) විශේෂයෙන්ම ගැටුමෙහි බලපෑමට ලක් වූ කලාපවල කාන්තාවන් වෙනුවෙන් තවදුරටත් පවතින අනාරක්ෂිත වාතාවරණය;

(ආ) විශේෂයෙන්ම උතුරේ හා නැගෙනහිර හා විශේෂිතවම දෙමළ කාන්තාවන්, ගෘහමූලික කාන්තාවන් හා හිටපු සටන්කාරියන්, යුද්ධයෙන් වැන්දඹුභාවයට පත්වූවන් හා සත්‍යය, යුක්තිය හා වගවීම ඉල්ලා සිටින අතුරුදහන් වූවන්ගේ පවුල්වල කාන්තා සාමාජිකාවන් මෙන්ම කාන්තා මානව හිමිකම් ආරක්ෂා කිරිමට කටයුතු කරන්නියන් ඉලක්ක කරගනිමින් හමුදාව හා පොලීසිය අඩන්තේට්ටම් කිරීම්, ස්ත්‍රී දූෂණය, පැහැර ගැනීම්, වධ හිංසා පැමිණවීම්, ලිංගික අල්ලස්, ලිංගික වහල්භාවය ඇතුළු ප්‍රචණ්ඩ ක්‍රියා හා බලහත්කාරයෙන් නිවෙස්වලට ඇතුව වීම වැනි අසාධාරණ අධීක්ෂණයෙහි යෙදුන බවට වන බරපතලචෝදනා; සහ

(ඇ) සන්නද්ධ හමුදා සහ පොලිසිය විසින් කාන්තාවන්ට එරෙහිව සිදු කරන ලද ලිංගික හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්ව ක්‍රියාවන්ට අදාලව විමර්ශන, අභිචෝදනයන්, වරදකරු කිරීම් හා පනවන ලද සිර දඬුවම් සංඛ්‍යාව පිළිබඳව කමිටුව විසින් ඉල්ලා සිටින ලද දත්ත ඉදිරිපත් කිරීමට රාජ්‍ය පාර්ශ්වය අසමත් වී තිබීම.

25. ප්‍රඥප්තියට හා කමිටුවේ පොදු නිර්දේශ අංක 30 (2013) ට අනුකූලව රාජය පාර්ශ්වය පහත සඳහන් දේ ඉටු කළ යුතු බවට කමිටුව නිර්දේශ කරයි:

(අ) හමුදාව හා පොලිසිය විසින් ලිංගික ප්‍රචණ්ඩත්වෙයහි යෙදීම කිසිසේත් නොඉවසීමේ ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරීම, අත්තනෝමතික අත් අඩංගුවට ගැනීම්, වධහිංසා සහ ලිංගික ප්‍රචණ්ඩත්වය මෙන්ම අවේක්ෂණය හා අඩන්තේට්ටම් කිරීම ඇතුළුව කාන්තාවන්ට හා ගැහැනු ළමුන්ට එරෙහිව සිදු කරන ලද ප්‍රචණ්ඩත්වය පිළිබඳ සියලු චෝදනා විමර්ශනය කිරීම, ඒවාට අදාල අභිචෝදනය සහ දඬුවම් පැමිණවීම් කඩිනම් කෙරන බවට වගබලා ගැනීම;

(ආ) ජාතික විමර්ශන හා අභිචෝදන ධාරිතා මෙන්ම විදේශීය සාක්ෂිකරුවන්ද ඇතුළුව සාක්ෂිකරුවන්ගේ ආරක්ෂා සහිත සහ රහස්‍ය සාක්ෂි දීම් මගින් ඇතුළුව සාක්ෂිකරුවන් හා වින්දිතයන් ආරක්ෂා කිරීම සහ ඔවුන්ට සහාය විම වෙර ගැන්වීම සහ අභිචෝදනයන් අපක්ෂපාතීව, විෂය මූලිකව හා කලට වේලාවට, ජාත්‍යන්තර ප්‍රමිතිවලට අනුකූලව සිදු වන බවට වග බලාගැනීම සහ හානිපූරණය සඳහා වින්දිතයන් සතු අයිතිය උල්ලංඝනය කිරීම පිලිබඳව සත්‍යය දැනගැනීමට වින්දිතයන් සහ සමාජය සතු අයිතිය සහ උල්ලංඝනය කිරීම් යළි සිදු නොවන බවට ප්‍රතිඥා ජාත්‍යන්තර නිතියට අනුකූලව සහතික කිරීම;

(ඇ) ලිංගික ප්‍රචණ්ඩත්ව සිද්ධිවලට අදාලව සිදු කෙරෙමින් පවතින සියළු අපරාධ විමර්ශන,විභාග වෙමින් පවතින හබයාස් කෝපුස් හා මූලික අයිතිවාසිකම් පෙත්සම් මෙන්ම විශේෂයෙන්ම සන්නද්ධ හමුදා හා පොලීසිය සම්බන්ධ වූ සිද්ධි සමග සියලු විමර්ශන කොමිෂන් සභා මගින් හෙළිදරව් කරගත් කරුණු පරිපූර්ණ ලෙස සිතියම්ගත කිරිමක් සිදු කිරීම.

මිනිස් ජාවාරම සහ ගණිකා වෘත්තිය සූරා කෑම

26. මිනිස් ජාවාරම නිරීක්ෂනය කිරීම සහ එයට එරෙහිව සටන් කිරීම සඳහා ජාතික උපායමාර්ගික සැලැස්ම (2015-2019) 2016 දී සම්මත කර ගැනීම කමිටුව අගය කරයි. කෙසේ වෙතත් එය ක්‍රියාත්මක කිරිම සඳහා ඇති අභියෝග සැලකිල්ලට ගන්නා කමිටුව ජාවාරම්කරුවන් පිළිබඳ විමර්ශනය කිරීම්, ඔවුන්ට අභිචෝදනා කිරීම් සහ දඩුවම් පැමිණවීම් සංඛ්‍යාවේ අල්ප බව පිළිබඳ සිය උනන්දුව (CEDAW/C/LKA/CO/7) යළි අවධාරණය කරයි. සැපයීම යන වරද සම්බන්ධයෙන් අභිචෝදනයන්හිදී මිනිස් ජාවාරම අපරාද වරදක් ලෙස විධිවිධාන සලස්වන දණ්ඩ නීති සංග්‍රහයේ 306 (ඇ) වගන්තිය මත පදනම් වනු වෙනුවට 360(අ) වගන්තිය මත පදනම්වීමද කමිටුව කණස්සලු සහගතව සටහන් කරයි. ගෘහ සේවිකාවන්ට විගමනය සඳහා අවම වයස් සීමාව මිනිස් ජාවාරම දිගින් දිගටම පැවැත්මට හේතු විය හැකි බවටද එය තවදුරටත් කණස්සල්ල පළ කරයි. ගණිකා වෘත්තියෙහි යෙදෙන කාන්තාවන් සන්තකයෙහි උපත් පාලනක කොපු තිබීම ඔවුන් ගණිකා වෘත්තියෙහි යෙදෙන බවට සාක්ෂියක් ලෙස භාවිතා කරමින් එම කාන්තාවන්ව අත්තනෝමතික ලෙස අත්අඩංගුවට ගැනීමට හා ඔවුන්ව අඩන්තේට්ටම් වලට, ලිංගික අල්ලස්වලට හා බලෙන් මුදල් ලබාගැනිමට භාජනය කිරිම සඳහා පොලිසිය විසින් අයාල ආඥාපනත භාවිතා කරනු ලැබීම පිළිබඳව තම කනස්සල්ල (CEDAW/C/LKA/00/7, 28 ඡේදය) කමිටුව තවදුරටත් අවධාරනය කරයි.

27. සිය පෙර ඉදිරිපත් කරන ලද නිර්දේශ (CEDAW/C/LKA/CO/7, 27 හා 29 ඡේද) යළි අවධාරණය කරන කමිටුව, මිනිස් ජාවාරම සහ ලිංගික හා වෙනත් ආකාරයේ සූරාකෑම් ඇතුළුව පොදු හා පෞද්ගලික අවකාශ තුළ සියළු කාන්තාවන්ට හා ළමුන්ට එරෙහි සියළු ආකාරයේ ප්‍රචණ්ඩත්වය තුරන් කිරීම පිණිස වන තිරසාර සංවර්ධනය ඉලක්ක 5, 5.2 ඉලක්කය කෙරෙහි අවධානය යොමු කරවමින් රාජ්‍ය පාර්ශ්වය පහත සඳහන් දේ ඉටු කිරීම නිර්දේශ කරයි.

(අ) මිනිස් ජාවාරම නිරීක්ෂණය කිරීම හා එයට එරෙහිව සටන් කිරීම සඳහා වන ජාතික උපායමාර්ගික සැලැස්ම (2016) සඵලදායක ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රමාණවත් මානව, තාක්ෂණික හා මූල්‍ය සම්පත් සැහෙන බවට වග බලා ගැනීම;

(ආ) රැකවරණ නිවාස, නීති, වෛද්‍ය සමහ මනෝ සමාජමය සහාය කරා ප්‍රවේශය සැපයීම මගින් ඇතුළුව මිනිස් ජාවාරම් වින්දිතයන් කල්වේලා ඇතිව හඳුනාගැනීම, යොමු කිරීම, පුනරුත්ථාපනය සහ සමාජානුයෝජනය

සම්බන්ධයෙන් නීතිය ක්‍රියාවේ යෙදවීමේ සහ අනෙකුත් රජයේ අදාළ නිලධාරීන්ට අඛණ්ඩ ධාරිතා වර්ධනය සැපයීම;

(ඇ) මිනිස් ජාවාරමෙහි යෙදෙන්නන් එයින් වැළැක්වීම, අභිචෝදනය සහ ඔවුනට ප්‍රමාණවත් ලෙස දඬුවම් පැමිණවීම සහ කාන්තා වින්දිතයන් සහ වින්දිතයන් වූ ගැහැණු ළමුන් වෙනුවෙන් ස්ත්‍රී පුරුෂ සමාජභාවයට විශේෂිත වූ ආරක්ෂණ ක්‍රියාමාර්ග යොදා ගැනීම;

(ඇ) දණ්ඩ නීති සංග්‍රහයේ 360 (ඇ) වගන්තිය යටතේ මිනිස් ජාවාරම්කරුවන්ට අභිචෝදනය සඳහා බාධා පමුණුවන නීතියේ පවතින හිදැස් වෙනුවෙන් විසඳුම් සැපයීම;

(ඉ) ගණිකා වෘත්තිය සුරා කෑම හා පුද්ගල ජාවාරම යන දෙකම සම්බන්ධයෙන් ස්ත්‍රී පුරුෂ බව අනුව වෙන් කරන ලද දත්ත ක්‍රමානුකූලව රැස් කිරීම;

(ඊ) කලාපයේ අනෙකුත් රටවල් සමග අවබෝධතා ගිවිසුම් අත්සන් කිරීම මගින් හා විශේෂයෙන්ම අසල්වැසි රාජ්‍ය සහ දකුණු ආසියානු කලාපීය සහයෝගිතා සංගමයට (SAARC) අයත් අනෙකුත් රාජ්‍ය සාමාජිකයන් සමග මිනිස් ජාවාරම්කරුවන්ට අභිචෝදනය සඳහා නෛතික පටිපාටිවල අනුකූලතාව ඇති කිරීම මගින් ඇතුළුව මිනිස් ජාවාරම වැළැක්වීම සඳහා ද්විපාර්ශ්වික කලාපීය සහ ජාත්‍යන්තර සහයෝගිතාව වෙනුවෙන් ප්‍රයත්න තීව්‍ර කිරීම;

(උ) අයාල ආඥාපනත පරිච්ඡින්න කිරීම සහ ඒ අතරවාරයේදී ගණිකා වෘත්තියෙහි යෙදෙන කාන්තාවන්ට මෙන්ම ලිංගික සුළුතර කාන්තාවන්ට අඩන්තේට්ටම් කිරීම සඳහා පනත අවභාවිතා කරන පොලිස් නිලධාරීන්ට දඬුවම් පැමිණවීම සහ ගණිකා වෘත්තියෙන් ඉවත් වීමට කැමති කාන්තාවන් වෙනුවෙන් ඒ සඳහා වැඩසටහන් ඇතුළුව ස්ත්‍රී පුරුෂ සමාජ භාවයට සංවේදී ආරක්ෂාව හා සහාය සැපයෙන බවට වග බලා ගැනීම.

දේශපාලනය සහ පොදු ජීවිතය හා තීරණ ගැනීම තුළ සහභාගිත්වය

28. පළාත් පාලන ඡන්ද විමසීම් (සංශෝධන) පනත තුළ පළාත් පාලන මට්ටමේ කාන්තාවන් පත් කිරීම සඳහා 25% ක කෝටාව සම්මත කර ගැනීම සහ එක් එක්

පළාත වෙනුවෙන් දේශපාලන පක්ෂවල නාමයෝජනා පත්‍රවල කාන්තාවන් වෙනුවන් 30%ක කෝටාවන් (අවම) බලාත්මක කිරීම සඳහා 1988 අංක 2 දරන පළාත් සභා ඡන්ද විමසීම් පනත සංශෝධනය කිරීම සඳහා යෝජනාවකට 2016 දි අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබීම කමිටු අගය කරයි. කෙසේ වෙතත් පසුගිය වසර 15 පුරා ජාතික පාර්ලිමේන්තුවේ කාන්තා නියෝජනය 5% ක් පමණක් වී ඇති බවත් අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරියන් සංඛ්‍යාව ඉතාම අඩු සංඛ්‍යාවක්ව පවතින බවත් එය කණස්සලු සහගතව සැලකිල්ලට ගනී. තවද, තීරණ ගැනීමේ ක්‍රියාවලි තුළ, දෙමළ හා මුස්ලිම් කාන්තාවන් සහ ආබාධිත කාන්තාවන් වැනි සුළුතර කොටස්වල නියෝජනය සම්බන්ධයෙන් තොරතුරු නොමැති වීම සම්බන්ධයෙන් එය කණගාටුව පළ කරයි.

29. දේශපාලන සහ පොදු ජීවිතය තුළ කාන්තාවන් සම්බන්ධයෙන් සිය පොදු නිර්දේශ අංක 23 (1997) සමග අනුකූලව සිය පෙර නිර්දේශ (A/57/38, 279 ඡේදය සහ CEDAW/C/LKA/CO/7, 31 ඡේදය) යළි අවධාරණය කරන කමිටුව, ජාතික සහ ප්‍රාදේශීය මට්ටම් වලදි තීරණ ගැනීමේදි කාන්තාවන්ගේ පූර්ණ සහ සමාන සහභාගිත්වය ප්‍රවර්ධනය කිරීම ඉලක්ක කරගත් තිරසාර ප්‍රතිපත්ති අනුගමනය කිරීමට රාජ්‍ය පාර්ශ්වය කටයුතු කළ යුතු බවට තවදුරටත් නිර්දේශ කරයි:

(අ) පළාත් මට්ටමේදී දේශපාලන පක්ෂවල නාමයෝජනා පත්‍ර තුළ අපේක්ෂිකාවන් වෙනුවෙන් යෝජිත අංක 30% කෝටාව නිශ්චිත කාලරාමුවක් තුල බලාත්මක කෙරෙන බවට වග බලා ගැනීම සහ ජාතික මට්ටමේ අපේක්ෂිකාවන් වෙනුවෙන්ද ඒ හා සමාන කෝටා ක්‍රමයක් හඳුන්වා දීම;

(ආ) ප්‍රඥප්තියෙහි 4(1) වගන්තිය සහ තාවකාලික විශේෂ ක්‍රියාමාර්ග පිලිබඳව කමිටුවේ පොදු නිර්දේහ අංක 25 (2004) සමග අනුකූලව සුළුතර කණ්ඩායම් ඇතුළුව කාන්තාවන්ගේ ඉලක්කගත නියෝජනය සහතික කිරීමේ අරමුණින්, සුළුතර කාන්තාවන් ඇතුළු කාන්තාවන් වෙනුවෙන් නෛතික කෝටා ආකාරයෙන්. තාවකාලික විශේෂ ක්‍රියාමාර්ග ඇතුළු ක්‍රියාමාර්ග යොදා ගැනීම;

(ඇ) පවුල හා සමාජය තුළ කාන්තාවන් හා පිරිමින් සතු කාර්යභාර සම්බන්ධයෙන් වෙනස් කොට සලකන ඒකාකෘති තුරන් කිරිම සඳහා තීරණ ගැනීම තුළ කාන්තා සහභාගිත්වයෙහි වැදගත්කම පිළිබඳව පොදු ජනතාව සහ දේශපාලන පක්ෂ ඉලක්ක කරගනිමින් දැනුවත් කිරීමෙස් වැඩසටහන් මෙහෙයවීම;

(ඇ) සියළු අංශ තුළ සියළු මට්ටම් වලදී, තීරණ ගැනීමේ තනතුරුවල විවිධ සුළුතර කොටස් නියෝජනය කරන කාන්තාවන්ගේ සහභාගීත්වය සම්බන්ධයෙන් වෙන් කරන ලද දත්ත රැස් කිරිමේ ක්‍රමයක් ස්ථාපනය කිරිම

අධ්‍යාපනය

30. කාන්තාවන්ගේ ඉහළ සාක්ෂරතා මට්ටම, ප්‍රාථමික මට්ටමේ අධ්‍යාපනයට ගැහැණු පිරිමි ලමුන් සියළු දෙනාම පාහේ ඇතුළත් විම සහ අධ්‍යාපනය ලැබීමේ අනිවාර්ය වයස් සීමාව 14 සිට 16 දක්වා ඉහළ නැංවීම සම්බන්ධයෙන් කමටුව ප්‍රශංසා කරයි. කෙසේ වෙතත්, කමිටුව පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් කණස්සල්ල පල කරයි.

(අ) අඩු ආදායම්ලාභි පවුල්වල කාන්තාවන්, විශේෂයෙන්ම වාර්ගික සුළුතර කණ්ඩායම් වල කාන්තාවන් අතර, උතුරු සහ නැගෙනහිර පළාත්වල ධිවර හා වැවිලි ප්‍රදේශ අසල පිහිටි පාසල්වල, නාගරික හා ගම්බද දූගී ප්‍රදේශවල දෙමව්පියන් එතෙර සේවය කරන විගමනික ශ්‍රමිකයන්ගේ දරුවන් අතර, කාන්තා ගෘහමූලිකයන්ගේ ගැහැණු දරුවන්, ළමා හා අඩු වයස් විවාහ වල වින්දිතයන් සහ ආබාධිත ගැහැණු ළමුන් අතර අඩු අධ්‍යාපන මට්ටම;

(ආ) වන්දි ලබාදීමේ හා ප්‍රතිසන්ධාන ක්‍රියාමාර්ගයක්. ගැටුම් ප්‍රදේශවල ගැහැනු ළමුන් පාසල් තුලදී අඩන්තේට්ටම්, අපයෝජනය හා ප්‍රචණ්ඩත්වයට ලක් වීමෙන් ආරක්ෂා කර ගැනීමේ ක්‍රියාමාර්ගයක් ලෙස අධ්‍යාපනය ලබා දීමේ වැඩසටහන් නොමැති වීම;

(ඇ) තෘතිය මට්ටමේ අධ්‍යාපනයේදී STELA විෂයයන් තුළ (විද්‍යාව, තාක්ෂණය. ඉංජිනේරු විද්‍යාව සහ ගණිතය) කාන්තාවන්ගේ හා ගැහැණු ළමුන්ගේ ,ගුරුවරින්ගේ හා පර්යේෂිකාවන්ගේ ඌන නියෝජනය;

(ඈ) විශේෂයෙන්ම ගැටුමේ බලපෑමට ලක් වූ ප්‍රදේශ තුළ ගැහැනු ළමුන් වෙනුවෙන් ප්‍රමාණවත් යටිතල පහසුකම් සහිත වෘත්තීය පාසල් සංඛ්‍යාව අඩුවීම; සහ

(ඉ) අඩු වයස් ගැබ් ගැනීම් ගැහැනු ළමුන් පාසල් වලින් ගිලිහී යාමට හේතුවක්ව පැවතීම.

31. අධ්‍යාපනය තුළ ස්ත්‍රී පුරුෂ සමාජභාවය විෂමතා තුරන් කිරීම සඳහා තිරසාර සංවර්ධන ඉලක්ක 4.5 ඉලක්කය සමග අනුකූලව සිය (A/57/38, 281 ඡේදය සහ CEDAW/C/LKA/CO/7 33 ඡේදය) යළි සිහිපත් කරවන කමිටුව, රාජ්‍ය පාර්ශ්වය පහත සඳහන් දේ ඉටු කිරීම තවදුරටත් නිර්දේශ කරයි.

(අ) ප්‍රඥප්තියෙහි 4 වගන්තියෙහි 1 ඡේදය සහ කමිටුවේ පොදු නිර්දේශ අංක 25 (2004) සමඟ අනුකූලව අධ්‍යාපනය කරා ප්‍රවේශය තුළ ඇති විෂමතා තුරන් කිරීම ඉලක්ක කරගත් තාවකාලික ක්‍රියාමාර්ග යොදා ගැනීම;

(ආ) අධ්‍යාපනයේ සියළු මට්ටම් වලදී මානව හිමිකම් හා සාම අධ්‍යාපනය ක්‍රියාත්මක කිරීම, අධීක්ෂණය හා ඇගයුම සිදුවන බවට වගබලා ගැනීම;

(ඇ) අධ්‍යාපනය තුළ අසාධාරණ ලෙස සලකන ස්ත්‍රී පුරුෂ සමාජභාව ඒකාකෘතිවලට එරෙහිව සටන් කිරීම සහ අධ්‍යාපන අංශ සංවර්ධන රාමුව හා වැඩසටහන ඇතුළුව ජාතික අධ්‍යාපන ප්‍රතිපත්ති තුළට ස්ත්‍රී පුරුෂ සමාජභාවය ප්‍රධාන ප්‍රවාහගත කිරිම හා ප්‍රාථමික මට්ටමේ පාසල් විෂයමාලාවන් තුළට ස්ත්‍රී පුරුෂ සමාජභාව සමානාත්මතාව සමෝධානය කිරීම;

(ඈ) තාක්ෂණික අංශ තුළ රැකියාවන් කරා ප්‍රවේශය ලබා ගැනිමට කාන්තාවන්ට සුදුසුකම් ලබා දීමේ අරමුණ ඇතිව, තාක්ෂණික අධ්‍යයන ක්ෂේත්‍ර හා රැකියා මාර්ග කරා කාන්තාවන් හා ගැහැනු ළමුන් නැඹුරු කිරීම සඳහා තාක්ෂණික අධ්‍යාපන හා වෘත්තීය පුහුණු අංශය තුළ ඉහළ තාක්ෂණික කුසලතා තුළ තාවකාලික විශේෂ ක්‍රියාමාර්ග ඇතුළුව, ස්ත්‍රී පුරුෂ සමාජභාවය කෙරෙහි සංවේදී වැඩසටහන් සකස් කර ව්‍යාප්ත කිරීම;

(ඉ) අඩු වයස් ගැබ්ගැනීම් වැළැක්වීම කෙරෙහි විශේෂ අවධානය සහිතව, වගකීම් සහිත ලිංගික චර්යාව ආමන්ත්‍රණය කරන, ලිංගික හා ප්‍රජනන සෞඛ්‍යය හා අයිතිවාසිකම් පිළිබඳ වයසට ගැලපෙන පරිපූර්ණ අධ්‍යාපනය ආයතනගත කිරීම.

රැකියා

32. ශ්‍රම වෙළඳපොළ තුළ කාන්තාවන්ගේ ඓතිහාසික අඩු සහභාගිත්වය හා කාන්තාවන් අතර පවතින ඉහළ විරැකියා අනුපාතිකය කෙරෙහි කමිටුව අවධානය යොමු කරවයි.

ස්ත්‍රී පුරුෂ සමාජභාවය අනුව වේතන අතර පවතින පුළුල් පරතරය, සමාන වටිනාකමක් ඇති වැඩ වෙනුවෙන් සමාන වැටුප් ගෙවීමේ මූලධර්මය ක්‍රියාත්මක කිරීම සහ අධීක්ෂණය කිරීම සීමාසහිත වීම සහ කාන්තාවන් අවිධිමත් රැකියා අංශයට සංකේන්ද්‍රණය වී සිටීම සම්බන්ධයෙන් එය සැලකිලිමත් වෙයි. සේවා ස්ථානවලදී කාන්තාවන්ට ලිංගික අඩන්තේට්ටම් සිදුවීම් සහ එයට විසඳුම් සැපයීමට ගන්නා ලද ක්‍රියාමාර්ග පිළිබඳව වෙන් කරන ලද දත්ත නොමැති වීම සම්බන්ධයෙන් එය කනස්සලු වෙයි. හිටපු සටන් කාරියන්ගේ විශේෂිත කුසලතා සැලකිල්ලට ගනිමින් නැවත රැකියාවන්හි යෙදීමට ඔවුනට පහසුකම් සැලසීම සඳහා පුළුල් ක්‍රියාමාර්ග නොමැති බව ද එය කණස්සලු සහගතව සටහන් කරයි.

33. රාජ්‍ය පාර්ශ්වය පහත සඳහන් දේ කළ යුතු බවට කමිටුව නිර්දේශ කරයි:

(අ) සම්ප්‍රදායිකව පුරුෂ ආධිපත්‍යය යටතේ පවතින රැකියා ක්ෂේත්‍ර තුළට කාන්තාවන්ට ඇතුළු වීම සඳහා පහසුකම් සලසන ක්‍රියාමාර්ග යොදා ගැනීම;

(ආ) අවිධිමත් අංශයේ මෙන්ම නිදහස් වෙළඳ කලාපවල සේවය කරන කාන්තාවන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සහ ප්‍රවර්ධනය කිරීම සඳහා නීති හා ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම;

(ඇ) අඛණ්ඩව වැටුප් සමීක්ෂණ සිදු කිරීම හා රැකියා නියුක්ති සහ බඳවාගැනීම් පරිචයන් වෙනුවෙන් සඵලදායක අධීක්ෂණ හා නියාමන යාන්ත්‍රණ ස්ථාපනය කිරීම මගින් ස්ත්‍රී පුරුෂ සමාජභාවය අනුව වේතන අතර පවතින පරතරය අඩු කිරීම;

(ඈ) අපරාධකරුවන්ට පනවන ලද දඬුවම් ද ඇතුළුව රාජ්‍ය සහ පෞද්ගලික යන දෙඅංශයේම ලිංගික අඩන්තේට්ටම් පිළිබඳව වෙන් කරන ලද දත්ත රැස් කිරීම;

(ඉ) ඒකාකෘති වලින් නිදහස්ව යෝග්‍ය රැකියා සහ වෘත්තිය පුහුණු අවස්ථා කරා ප්‍රවේශ වීම සඳහා හිටපු සටන්කාරියන්ට සහාය ලබා දීම;

(ඊ) ගෘහ සේවිකාවන්ට සුනිසි රැකියා සම්බන්ධ ලෝක කම්කරු සංවිධාන ප්‍රඥප්ති අංක 189 (2011) අපරානුමත කිරීම.

සෞඛ්‍යය

34. සියළු පුරවැසියන්ට නොමිලේ වෛද්‍ය සේවා සැපයීම ඇතුළුව සෞඛ්‍යය වෙනුවෙන් රාජ්‍ය පාර්ශ්ව ආයෝජන පිළිබඳව කමිටුව එයට ප්‍රශංසා කරයි. මාතෘ හා ළමා මරණ අනුපාතිකයෙහි අඩුවීමද එය තවදුරටත් අගය කරයි. ගබ්සාව අපරාධ වරදක් නොවන තත්ත්වයට පත් කිරීම සම්බන්ධයෙන් 2016 දී අධිකරණ අමාත්‍යවරයා විසින් පත් කරන ලද කමිටුවේ නිර්දේශ කෙරෙහි එය තවදුරටත් සැලකිලිමත් වෙයි. කෙසේ වෙතත් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් නිශ්චිත තොරතුරු හෝ දත්ත නොමැති වීම පිළිබඳව එය කණස්සලු වෙයි:

(අ) ගැටුමෙහි බලපෑමට ලක් වු ප්‍රදේශ වල සහ වතු ක්ෂේත්‍රයෙහි කාන්තාවන්ට සෞඛ්‍ය සේවා පැවතීම හා ඒවායේ ගුණාත්මක බව මෙන්ම යුද්ධයෙහි බලපෑමට ලක්වූ කාන්තාවන්ගේ මනෝ සමාජමය ක්ෂතියට විසඳුම් සැපයීම සඳහා වැඩසටහන් සහ සහාය පැවතීම;

(ආ) සියළු කාන්තාවන්ගේ සහ ගැහැණු ළමුන්ගේ අවශ්‍යතා සැලකිල්ලට ගන්නා ලිංගික සෞඛ්‍ය තොරතුරු පැවතීම හා ඒවා කරා ප්‍රවේශ වීමට හැකියාව;

(ඇ) කාන්තාවන් සහ ගැහැණු ළමුන් අතර ඇතුළුව HIV/AIDS පැවතීම සම්බන්ධයෙන් රාජ්‍ය පාර්ශ්ව තුළ දත්ත නොමැතිවීම සහ HIV/AIDS කල්වේලා ඇතිව වැලැක්වීම සහ කල් වේලා ඇතිව හඳුනාගැනීම සඳහා වැඩසටහන් පැවතීම.

35. කාන්තාවන් සහ සෞඛ්‍යය පිළිබඳ සිය පොදු නිර්දේශ අංක 24 (1999) යළි සිහිපත් කරන කමිටුව, ගෝලීය මාතෘ මරණ අනුපාතික අඩු කිරිම සහ ලිංගික සහ ප්‍රජනන සෞඛ්‍ය සේවාවන් කරා සියළු දෙනාටම ප්‍රවේශය සහතික කිරීම පිළිබඳ තිරසාර සංවර්ධන ඉලක්ක 3, 3.1, සහ 3.7 ඉලක්ක කෙරෙහි අවධානය යොමු කරවන අතර රාජ්‍ය පාර්ශ්වය පහත සඳහන් දේ ඉටු කිරීම නිර්දේශ කරයි:

(අ) ගර්භනී කාන්තාවගේ ජීවිතයට තර්ජනයක් ඇති අවස්ථාවල පමණක් නොව, සියළු ස්ත්‍රී දූෂණ, ව්‍යභිචාර සහ කළලයට දැඩි හානි සිදු වි ඇති අවස්ථාවලදී ගබ්සාව

නිත්‍යානුකූල කිරීමටත්, අනෙක් සියළු සිද්ධිවලදී ගබ්සාව අපරාධ වරදක් නොවන තත්ත්වයට පත් කිරීමටත් සිය නීති සංශෝධනය කිරීම;

(ආ) ගර්භණී භාවය වෛද්‍යාම අවසන් කිරීමක් අවශ්‍යද යන්න පිළිබඳව අධිකරණ විමර්ශනයක් අවශ්‍ය වීම සහ ගබ්සාවකට බලය පවරන වෛද්‍ය සහතිකයක අවශ්‍යතාව වැනි ආරක්ෂා සහිත ගබ්සා සේවාවන් කරා කාන්තාවන් සතු ප්‍රවේශයට පවතින බාධක ඉවත් කිරීම;

(ඇ) විශේෂයෙන්ම ලිංගික හා ප්‍රජනන සෞඛ්‍යය වෙනුවෙන් ගැටුමේ බලපෑමට ලක් වූ ප්‍රදේශවල හා වැවිලි අංශයේ කාන්තාවන්ගේ සෞඛ්‍ය අවශ්‍යතා ඉටු කිරීම සඳහා ප්‍රමාණවත් අයවැය වෙන් කිරීම් සිදු කිරීමට වග බලා ගැනීම;

(ඈ) සියළු කාන්තාවන්ට හා ගැහැණු ළමුන්ට ලිංගිකත්ව තොරතුරු කරා ප්‍රවේශය ඇති බවට වග බලා ගැනීම; සහ

(ඉ) HIV ආසාදනය, සම්ප්‍රේෂණය සහ පැවතීම මෙන්ම HIV/AIDS සමඟ ජීවත්වන කාන්තාවන් හා ගැහැණු ළමුන් වෙනුවෙන් වැළැක්වීමේ හා කල්වේලා ඇතිව හඳුනාගැනීමේ වැඩසටහන පැවතීම හා ඒවා කරා ප්‍රවේශය තිබීම පිළිබඳව කලාප විශේෂිත දත්ත ලබා දීම.

ගෘහ මූලික කාන්තාවන්

36. ජාතික ක්‍රියාකාරි සැලැස්මක් (2017 - 2019) සමග ඉදිරිපත් කරන ලද ගෘහමූලික කාන්තාවන් පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය (2016) කමිටුව අගය කරයි. රාජය පාර්ශ්වය තුළ කාන්තා ජනගහනයෙන් 24% ක් සෑදුම් ලබන ගෘහ මූලික කාන්තාවන් ඉහළ අනුපාතිකය සැලකිල්ලට ගන්නා කමිටුව, අන්ත්ර්ජේදනය වන වෙනස් කොට සැලකීම පිළිබඳ ඔවුන්ගේ අත්දැකීම තුළින් ඔවුන්ගේ අවදානමට පත් වීමේ හැකියාව තව තවත් වැඩිවීම සම්බන්ධයෙන් කනස්සලු වෙයි. කමිටුව පනත සඳහන් කරුණු කෙරෙහි කණස්සලු සහගත අවධානය යොමු කරයි:

(අ) 'කාන්තා ගෘහමූලිකයන් සිටින කුටුම්භ' සඳහා බලධාරීන් විසින් භාවිතා කරනු ලබන විවිධ හා බාධාකාරි නිර්වචන හේතුවෙන් ඔවුන් බොහෝ දෙනෙකුව සමාජ ප්‍රතිලාභ සහ සුභසාධන වැඩසටහන් වලින් බැහැර කරනු ලැබීම;

(ආ) මෙම සුබසාධක වැඩසටහන් වලට වෙන් කෙරෙන මුදල් ප්‍රමාණවත් නොවීම, ඒවා ක්‍රියාත්මක කිරීම සීමිත වීම, සුබසාධන වැඩසටහන් පිළිබඳ තොරතුරු නොමැති වීම හා ගෘහ මූලික කාන්තාවන්ගෙන් ලිංගික අනුග්‍රහය ඉල්ලා සිටීම හරහා පරිපාලන බලතල අවභාවිතා කිරීම;

(ඇ) ගෘහ මූලික කාන්තාවන් දුගී බවට පත් වීමේ අවදානම හා හිමිකරුවන් මගින් මෙහෙයවන නිවාස වැඩසටහන් වල සෘණාත්මක බලපෑමට ලක්වීම. මෙම තත්ත්වය උතුරු හා නැගෙනහිර පළාත්වල බොහෝ කුටුම්භයන්හි ණය ගැති භාවයෙහි මට්ටම වඩාත් නරක අතට පෙරලීමට හේතු වී ඇත;

(ඈ) කාන්තාවන්ට ණය කරා ඇති ප්‍රවේශය සීමිත වීමේ ප්‍රතිඵලයක් ලෙස පෞද්ගලික මූල්‍ය සමාගම් කාන්තාවන්ව සූරා කෑම;

(ඉ) උප්පැන්න සහතික, ඉඩම් ඔප්පු, ජාතික හැඳුනුම්පත් ආදිය යුද්ධය කාලය තුළ අස්ථානගත විම හේතුවෙන් උතුරේ හා නැගෙනහිර බොහෝ කාන්තාවන්ට නිවාස සඳහා ප්‍රදාන, ඉඩම් හා සමාජ සේවා කරා ප්‍රවේශ වීමට නොහැකි වීම.

37. 2002 දී නිකුත් කරන ලද සිය නිර්දේශ (A/57/38, 297 ඡේදය) යළි අවධාරණය කරන කමිටුව රාජ්‍ය පාර්ශ්වයට පහත සඳහන් දේ නිර්දේශ කරයි:

(අ) කණ්ඩායම තුළ පවතින විවිධත්වය සැලකිල්ලට ගනිමින් ගෘහ මූලික කාන්තාවන් පිළිබඳව වෙන් කරන ලද දත්ත සමුදායක් රාජ්‍ය පාර්ශ්වය තුළ ස්ථාපනය කිරීම සහ සුබසාධක සහ නැවත පදිංචි කිරීමේ ප්‍රතිපත්ති සහ වැඩසටහන් තුළ ඒකාකාර ලෙස භාවිතා කිරීම සඳහා ගෘහමූලික කාන්තාවන් පිළිබඳ පැහැදිලි හා සියල්ලන් ඇතුළත් කර ගන්නා වර්ගිකරණයක් වෙනුවෙන් එම දත්ත සමුදාය යොදා ගැනිම;

(ආ) අපරාධකරුවන්ට ප්‍රමාණවත් ලෙස දඬුවම් කෙරෙන බවට වගබලා ගනිමින් ලිංගික අල්ලස යන වරද ඇතුලත් කිරීම සඳහා අල්ලස් පනත සංශෝධනය කිරීම;

(ඇ) ගෘහ මූලික කාන්තාවන් වෙනුවෙන් සමාජ ආරක්ෂණ ක්‍රමයක් නිර්මාණය කිරීම හා සුබසාධක වැඩසටහන් වලට අදාල තොරතුරු පුළුල් ලෙස විසුරුවා හරිනු ලබන බවට වග බලා ගැනීම;

(ඇ) කාන්තාවන් වෙනුවෙන් ඇති අතිරේක අවශ්‍යතා ඉවත් කිරීම මගින් රජයේ හා පෞද්ගලික ආයතන වෙතින් බැංකු ණය, උකස් හා වෙනත් ආකාරයේ මූල්‍ය ණය ලබා ගැනීම සඳහා කාන්තාවන් හා පිරිමින් වෙනුවෙන් සමාන සුදුසුකම් ලැබීමේ නිර්ණායක පවතින බවට වගබලා ගැනීම;

(ඉ) දරිද්‍රතාවයෙන් දිවි ගෙවන ගෘහ මූලික කාන්තාවන් හා ඔවුන්ගේ පවුල් වෙනුවෙන් ඔවුන්ගේ ආදායම් උත්පාදන රටාවන්ට ගැලපෙන නැවත අය කර ගැනීමේ සැලසුම් සහිත අඩු පොලී හෝ පොලී රහිත ණය යෝජනා ක්‍රම හඳුන්වා දීම;

(ඊ) තමන්ගේම නමින් ජීවනෝපාය සහාය, නිවාස සහ ඉඩම් කරා කාන්තාවන්ට සමාන ප්‍රවේශය තහවුරු කිරීම සඳහා පෞද්ගලික ලිපි ලේඛන හා දේපල ඔප්පු නිකුත් කිරීම පිණිස මනා සම්බන්ධීකරණය සහිත ක්‍රමානුකූල ක්‍රමයක් ඇති කිරීම.

විගමනික කාන්තාවන්

38. විගමනික කාන්තාවන් මත පමණක් සීමාවන් පනවන, එනම් වයස අවුරුදු හයට අඩු දරුවන් වෙනුවෙන් භාරකරුවෙකු පත් කිරීම සහ වෙනස් කොට සලකන රෙගුලාසි පැවතීම සම්බන්ධයෙන් කමිටුව සැලකිලිමත් වෙයි. විශේෂ අවශ්‍යතා ඇති දරුවන් සිටින කාන්තාවන් විගමනයෙන් වළක්වනු ලබන බවද එය සටහන් කරයි.

39. විගමනය සම්බන්ධයෙන් ස්ත්‍රී පුරුෂ බවට විශේෂිත වූ සීමාවන් ඉවත් කිරීමේ අරමුණ ඇතිව රාජය පාර්ශ්වය පවුල් පසුබිම් වාර්තාව (MFE/RAD/10/13) අහෝසි කිරීම කමිටුව නිර්දේශ කරයි.

ග්‍රාමීය කාන්තාවන්

40. ග්‍රාමීය ආර්ථික සංවර්ධනය වෙනුවෙන් වන සියළු ආයෝජන වලින් අවම වශයෙන් 25% ක් කාන්තාවන්ට ප්‍රතිලාභ පිණිස වෙන් කිරීම සඳහා යෝජනාවකට 2016 දී අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබීම ඇතුළුව ග්‍රාමීය සංවර්ධනය ප්‍රවර්ධනය කිරීමේ අදහසින් රාජ්‍ය පාර්ශ්වය ගන්නා ප්‍රයත්නයන් කමිටුව සැලකිල්ලට ගනී. ජනගහනයෙන් 77% ක් ග්‍රාමීය ප්‍රදේශවල ජීවත් වන බව හා ග්‍රාමීය කර්මාන්තවල කාන්තාවන් සක්‍රියව නිරත වී සිටින බවද එය සටහන් කරයි. නායකත්වය තුළ ග්‍රාමීය කාන්තාවන්ගේ අඩු සහභාගිත්වය,

ඔවුන්ගේ දුෂ්කර සේවා තත්ත්වයන් හා අඩු වැටුප් හා ධීවර ක්ෂේත්‍රයේ කාන්තාවන් මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහි වීම ඉහළ මට්ටමක පැවතීම සම්බන්ධයෙන් කමිටුව කණස්සලු වෙයි. ඉඩම් උරුමය සම්බන්ධයෙන් උරුමක්කාරියන් අභිබවා උරුමක්කරුවන්ට වැඩි සැලකිල්ල දක්වන ඉඩම් සංවර්ධන ආඥාපනත (1935) මගින් ඉඩම් කරා කාන්තාවන්ගේ ප්‍රවේශය තවදුරටත් සීමා කරනු ලැබ තිබීම සම්බන්ධයෙන් ද කමිටුව තවදුරටත් කණස්සල්ල පළ කරයි.

41. ග්‍රාමීය කාන්තාවන්ගේ අයිතිවාසිකම් පිළිබඳ සිය පොදු නිර්දේශ අංක 34 (2016) යළි සිහිපත් කරන කමිටුව, රාජ්‍ය පාර්ශ්වයට පහත සඳහන් දේ නිර්දේශ කරයි:

(අ) කාන්තාවන්ට ප්‍රතිලාභ ලබා දෙන ග්‍රාමීය ආර්ථික සංවර්ධන ආයෝජන ක්‍රියාත්මක කිරීම, අධීක්ෂණය හා තක්සේරු කිරිම සහතික කිරිම සඳහා යාන්ත්‍රණයක් ස්ථාපනය කිරීම;

(ආ) ග්‍රාමීය කර්මාන්තවල වෘත්තීය සමිති නායකත්වයට කාන්තා සහභාගිත්වය තහවුරු කිරීම සඳහා තාවකාලික විශේෂ ක්‍රියාමාර්ග භාවිතා කිරිම;

(ඇ) ධීවර කර්මාන්තය තුළ පවතින අහිතකර සේවා තත්ත්වයන්ට විසඳුම් සැපයීම හා මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහි වී සිටින කාන්තාවන්ට සෞඛ්‍ය හා උපදෙශන සහාය ලබා දීම; සහ

(ඈ) ග්‍රාමීය කර්මාන්ත තුළ වැටුප් පරතරය සහ මාතෘ නිවාඩු ලබා නොදිම යන ගැටළුවලට විසඳුම් සැපයීම.

ඉඩම් මිලිටරිකරණය

42. රටේ ගැටුමෙහි බලපෑමට ලක්වූ ප්‍රදේශවල සිදුවෙමින් පවතින පෞද්ගලික ඉඩම් විශාල ප්‍රමාණ මිලිටරිකරණය, සිවිල් පරිපාලන වගකීම් හමුදාව විසින් පැහැර ගැනීම, සහ එහි ප්‍රතිඵලයක් ලෙස රාජ්‍ය පාර්ශ්වය තුළ කාන්තාවන් හා පිරිමින් මහා පරිමාණයෙන් අවතැන්වීම සම්බන්ධයෙන් කමිටුව කණස්සලු වෙයි. මෙම ප්‍රදේශවල අභ්‍යන්තර වශයෙන් අවතැන්වූවන් වෙනුවෙන් කඳවුරු 32 ක් තවදුරටත් පවතී. මෙබඳු මිලිටරිකරණය අභ්‍යන්තර වශයෙන් අවතැන්වූ කාන්තාවන් නැවත පදිංචි කරවීමටත්, ඔවුන්ගේ නිවාස ප්‍රශ්නයට කල් පවත්නා විසඳුම් ලබාදීමටත්, ඔවුන්ගේ ජීවනෝපාය යළි ආරම්භ කිරීමට ඔවුන් සතු හැකියාවටත් බාධකයක් වීම සම්බන්ධයෙන් එය විශේෂයෙන් කණස්සලු වෙයි.

43. ග්‍රාමීය කාන්තාවන්ගේ අයිතිවාසිකම් පිළිබඳ සිය පොදු නිර්දේශ අංක 34 (2016) යළි සිහිපත් කරන කමිටුව රාජ්‍ය පාර්ශ්වය වෙත පහත සඳහන් දේ නිර්දේශ කරයි:

(අ) විශේෂයෙන්ම උතුරේ ඉඩම් වලින් වහාම හමුදාව ඉවත් කර අවතැන් වූ පිරිමින්ට හා කාන්තාවන්ට ඔවුන්ගේ ඉඩම් යළි ලබාගෙන ජීවනෝපාය අවස්ථා කර ප්‍රවේශ වීමට හැකි වන පරිදි එම ඉඩම් ඔවුනට ලබා දීම හා සිවිල් පරිපාලන වගකීම් අත්පත් කර ගැනීමෙන් හමුදාව වළක්වනු ලබන බවට වග බලා ගැනීම;

(ආ) ප්‍රමාදයකින් තොරව එබඳු ඉඩම් ඒවායේ නීත්‍යානුකූල හිමිකරුවන්ට ආපසු ලබා දීමේ අරමුණ ඇතිව, දැනට හමුදාව අත්පත් කරගෙන සිටින හා දැනට හමුදා කාර්යයන් සඳහා භාවිතා නොකෙරෙන හෝ අසාධාරණ ලෙස භාවිතා කෙරෙන ඉඩම් නිසි ලෙස සිතියම් ගත කිරීම;

(ඇ) ගෘහ මූලික කාන්තාවන්ට හා අභ්‍යන්තර වශයෙන් අවතැන් වූ පුද්ගලයන්ට නිවාස කරා කල්පවත්නා හා ප්‍රමාණවත් ප්‍රවේශය පවතින බවට වගබලා ගැනීම සඳහා ජාතික මානව හිමිකම් ක්‍රියාකාරී සැලැස්මේ (2017 - 2021) නිර්දේශ ක්‍රියාත්මක කිරීම;

(ඈ) හමුදාව විසින්ද ඇතුළුව ඉඩම් අනවසරයෙන් අල්ලා ගැනීම් පිළිබඳව පැමිණිලි විමර්ශනය කර වැරදිකරුවන්ට ප්‍රමාණවත් ලෙස දඬුවම් පමුණුවනු ලබන බවට වගබලා ගැනීම.

විවාහය හා පවුල් සබඳතා තුළ වෙනස් කොට සලකන නීති :

44. මුස්ලිම් විවාහ හා දික්කසාද පනත සංශෝධනය කිරීම සඳහා 2016 වසරේදී අමාත්‍ය මණ්ඩල අනුකමිටුවක් පත් කරන ලද බව කමිටුව පිළිගනී. කෙසේ වෙතත්, මුස්ලිම් පෞද්ගලික නීතිය හා ක්වාසි අධිකරණ සලකා බලා යෝජනා ඉදිරිපත් කිරීම සඳහා 2009 වසරේදී අධිකරණ අමාත්‍යවරයා විසින් පත් කරන ලද කමිටුව නිර්දේශ කිසිවක් ඉදිරිපත් කර නොමැති බව එය සටහන් කරයි. මෙයට කරන ලද කනස්සල්ල පළ කිරීම (CEDAW/C/LKA/CO/7, 44 ඡේදය) යළි අවධාරණය කරන කමිටුව, මුස්ලිම් විවාහ මත බලපවත්වන එකම හා අනිවාර්ය නීතිය මුස්ලිම් විවාහ හා දික්කසාද පනත වීම අනුව විශේෂයෙන්ම පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සිය කණස්සල්ල පළ කරයි:

(අ) එය විවාහ වීම සඳහා අවම වයසක් නියම නොකරන අතර වයස අවු. 12 අඩු ගැහැණු ළමුන්ට විවාහ වීමට අවසර ලැබේ;

(ආ) එය ක්වාසි අධිකරණ වල නීති හා අධිකරණ නිලධාරී තනතුරු, ක්වාසි මණ්ඩල සාමාජිකත්වය, විවාහ රෙජිස්ට්‍රාර් හා විනිශ්චය කරන්නන්ගේ තනතුරු, මුස්ලිම් පුරුෂ පක්ෂයට පමණක් සීමා කරයි; සහ

(ඇ) මුස්ලිම් නීතිය යටතේ විවාහ වී, නිත්‍යානුකූලව වෙන් වී නොමැති කාලය තුළ සිය සැමියන් සමග ලිංගික සංසර්ගයේ යෙදෙන වයස අවු. 16 ට අඩු ගැහැණු ළමයින් සම්බන්ධයෙන් ව්‍යවස්ථාපිත ස්ත්‍රී දූෂණ නීතිය අදාල නොවේ.

45. විවාහය හා පවුල් සබඳතා තුළ සමානාත්මතාවය පිළිබඳ සිය පොදු නිර්දේශ අංක 21 (1994) සහ 16 වැනි වගන්තිය පිළිබඳ (විවාහය, පවුල් සබඳතා සහ ඒවා බිඳී යාමේ ආර්ථික ප්‍රතිවිපාක) පොදු නිර්දේශ අංක 29(2013) සහ හානිකර පරිචයන් පිළිබඳව කමිටුවේ ඒකාබද්ධ පොදු නිර්දේශ අංක 31 සහ ළමා අයිතිවාසිකම් පිළිබඳ කමිටුවේ පොදු අදහස් දැක්වීම් අංක 18 යළි සිහිපත් කරමින් කමිටුව සිය පෙර කරන ලද නිර්දේශ (CEDAW/C/LKA/CO/7 45 ඡේදය) යළි අවධාරණය කරන අතර රාජ්‍ය පාර්ශ්වය විසින් පහත සඳහන් දේ ඉටු කිරීම නිර්දේශ කරයි:

(අ) විවාහය, දික්කසාදය, උරුමය, දේපල හා ඉඩම් ඇතුළුව පවුල් සබඳතා තුළ කාන්තාවන්ගේ හා පිරිමින්ගේ සමාන අයිතිවාසිකම් ආමන්ත්‍රණය කරන ඒකාබද්ධ පවුල් නීති සංග්‍රහයක් ප්‍රඥප්තියට අනුකූලව පිළියෙල කිරීම;

(ආ) සාමාන්‍ය නීතිය යටතේ ලියාපදිංචි වීම සඳහා මුස්ලිම් පෞද්ගලික නීතියෙන් බැහැර වීමට තෝරා ගැනීමේ නිදහස මුස්ලිම් කාන්තාවන්ට ලබා දීම සහතික කිරිම සඳහා සාමාන්‍ය විවාහ ලියාපදිංචි කිරිමේ ප්‍රඥප්තිය සංශෝධනය කිරිම;

(ඇ) ආගමික නීති මගින් වෙනුවට සාමාන්‍ය සිවිල් ගිවිසුම්කර හා දේපල නීතිය මගින් දේපල හිමිකම් පාලනය වන බවට වග බලා ගැනිම;

(ඈ) රාජ්‍ය පාර්ශ්වය තුළ සියළු කාන්තාවන් වෙනුවෙන් විවාහ විමේ අවම වයස අවු. 18 දක්වා ඉහළ නැංවීම;

(ඉ) ක්වාසිවරුන්, ක්වාසි මණ්ඩල සාමාජිකයන්, විවාහ රෙජිස්ට්‍රාර්වරියන් හා විනිශ්චයකරුවන් ලෙස පත් කරනු ලැබීමට කාන්තාවන්ගේ යෝග්‍යතාව සම්බන්ධයෙන් පවතින කවර හෝ සීමා ඉවත් කිරීම; සහ

(ඊ) ව්‍යතිරේකයකින් තොරව, ව්‍යවස්ථාපිත ස්ත්‍රී දූෂණය යන අපරාධය වයස අවු. 16 ට අඩු සියළු ගැහැණු ළමුන්ට අදාල වන බවට වග බලා ගැනීම සඳහා දණ්ඩ නීති සංග්‍රහයේ 363 වන වගන්තිය සංශෝධනය කිරීම.

දත්ත රැස් කිරීම හා විශ්ලේෂණය කිරීම

ස්ත්‍රී පුරුෂ බව, වයස, ආබාධිත බව, වාර්ගිකත්වය, පදිංචිය සහ සමාජ ආර්ථික තත්ත්වය අනුව වෙන් කරන ලද පරිපූර්ණ දත්ත රැස් කිරීම, විශ්ලේෂණය හා බෙදා හැරීම සහ කාන්තාවන්ගේ තත්ත්වයෙහි ප්‍රවණතා හා ප්‍රඥප්තිය විසින් ආවරණය කෙරෙන සියළු ක්ෂේත්‍ර තුළ කාන්තාවන් අර්ථාන්විත සමානාත්මතාව සාක්ෂාත් කර ගැනීම කෙරෙහි ප්‍රගතිය තක්සේරු කිරීම සඳහා මිණිය හැකි දර්ශක භාවිතා කිරීම රාජ්‍ය පාර්ශ්වය ඉවැඩි කළ යුතු බවට කමිටුව නිර්දේශ කරයි.

බෙයිජිං ප්‍රකාශනය හා ක්‍රියාමාර්ග වෙනුවෙන් වේදිකාව

47. ප්‍රඥප්තියෙහි විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා රාජ්‍ය පාර්ශ්වය ගන්නා ප්‍රයත්න තුළ බෙයිජිං ප්‍රකාශනය හා ක්‍රියාමාර්ග වෙනුවෙන් වේදිකාව උපයෝජනය කරගන්නා ලෙස කමිටුව රාජ්‍ය පාර්ශ්වයෙන් ඉල්ලා සිටී.

තිරසාර සංවර්ධනය වෙනුවෙන් 2030 න්‍යාය පත්‍රය

48. තිරසාර සංවර්ධනය වෙනුවෙන් 2030 න්‍යාය පත්‍රය ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලිය මුළුල්ලේම ප්‍රඥප්තියෙහි විධිවිධානවලට අනුකූලව ස්ත්‍රී පුරුෂ සමාජභාව සමානාත්මතාව අර්ථාන්විතව සාක්ෂාත් කර ගැනීම සිදු විය යුතු බව කමිටුව ප්‍රකාශ කරයි.

විසුරුවා හැරීම

49. වර්තමාන අවසාන නිරීක්ෂණ පූර්ණ වශයෙන් ක්‍රියාත්මක කිරීමට හැකියාව ලබා දෙනු පිණිස, රාජ්‍ය පාර්ශ්වයේ රාජ්‍ය භාෂාවෙන් / භාෂාවලින් ඒවා සියළු මට්ටම් වල

(ජාතික, කලාපීය, ප්‍රාදේශීය) අදාල රාජ්‍ය ආයතන වෙත, විශේෂයෙන්ම රජය, අමාත්‍යාංශ, පාර්ලිමේන්තුව හා අධිකරණය වෙත කලට වේලාවට විසුරුවා හැරීම් සිදුවන බවට වග බලා ගන්නා මෙන් කමිටුව රාජ්‍ය පාර්ශ්වයෙන් ඉල්ලා සිටී.

තාක්ෂණික සහාය

50. රාජ්‍ය පාර්ශ්වය ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම තම සංවර්ධන ප්‍රයත්නයන්ට සම්බන්ධ කරගත යුතු බවටත් මේ සම්බන්ධයෙන් කලාපීය හෝ ජාත්‍යන්තර තාක්ෂණික සහාය ලබාගත යුතු බවටත් කමිටුව නිර්දේශ කරයි.

වෙනත් ගිවිසුම් අපරානුමත කිරීම

51. ජාත්‍යන්තර අපරාධ අධිකරණය පිළිබඳ රෝම ආඥාපනත සහ 1951 දී සම්මත කර ගන්නා ලද සරණාගතයන්ගේ තත්ත්වය හා සම්බන්ධ ප්‍රඥප්තිය අපරානුමත කිරීමටද කමිටුව ශ්‍රී ලංකා රජය දිරිගන්වයි.

අවසාන නිරික්ෂණ වලට අනුගාමී කරුණු :

52. ඉහත 13 (අ), 13(ආ) සහ 23 (ඇ) සහ 25 (ඇ) ඡේදවල අඩංගු නිර්දේශ ක්‍රියාත්මක කිරීමට ගනු ලබන පියවර පිළිබඳව ලිඛිත තොරතුරු වසර දෙකක් තුළ ලබා දෙන මෙන් කමිටුව රාජ්‍ය පාර්ශ්වයෙන් ඉල්ලා සිටී.

මිළඟ වාර්තාව පිළියෙල කිරීම

53. 2021 මාර්තු මසදි සිය නව වැනි ආවර්තක වාර්තාව ඉදිරිපත් කරන ලෙස කමිටුව රාජ්‍ය පාර්ශ්වයට ආරාධනා කරයි.

54. 'පොදු හර ලේඛන හා ගිවිසුම් විශේෂිත ලේඛන පිළිබඳව මාර්ගෝපදේශ ඇතුළුව ජාත්‍යන්තර මානව හිමිකම් ගිවිසුම් යටතේ වාර්තාකරණය පිළිබඳ සංයෝග කරන ලද මාර්ගෝපදේශ' අනුගමනය කරන ලෙස කමිටුව රාජ්‍ය පාර්ශ්වයෙන් ඉල්ලා සිටී.